වර්ථමානයේ අප ආහාර අර්බුදයකට මුහුණ පාමින් සිටින බැවින් අනාදිමත් කාලයක සිට අප රටේ පැවත එන ගෙවතු වගා සංකල්පය නැවත අවදි කිරීමට දැන් කාලය පැමිණ ඇත. වර්ථමාන ගෙවතු වගාව වැඩි දියුණු කිරීමේදී ප්‍රධාන සීමාකාරී සාධකයන් වී ඇත්තේ භූමිය සහ ජල සම්පතයි. මෙම බාධක ජය ගැනීම සඳහා සීමිත ඉඩකඩක වගා කිරීමට නව තාක්‍ෂණික ක්‍රම එළි දක්වා ඇති අතර ජල ගැටළුව විසඳීම සඳහා වැසි ජලය රැස් කිරීමේ තාක්‍ෂණය යෝග්‍යතම විකල්පය වී ඇත.

ගෙවතු වගාව සඳහා වැසි ජලය රැස් කිරීමේ ක්‍රම කිහිපයක් භාවිතා කල හැක.

1. වහලයෙන් වැටෙන ජලය ටැංකියකට රැස් කිරීම.
2. පොළව දිගේ ගලා යන ජලය එක් රැස් කිරීම

වහලයෙන් වැටෙන ජලය එක් රැස් කිරීම සඳහා පොළව මතු පිට ටැංකි,අර්ධ භූගත ටැංකි, භූගත ටැංකි භාවිතා කල හැක. පොළව මතු පිට ගලා යන ජලය එක් රැස් කිරීම සඳහා විශේෂයෙන් සාදන ලද සිලින්ඩරාකාර ටැංකි හෝ පතහ භාවිතා කල හැක.

මෙසේ රැස් කර ගන්නා වැසි ජලය භාවිතා කිරීමෙන් ගෙවතු වගාව සරු කර ගැනීම මෙන්ම භූගත ජල ප්‍රභව පෝෂණය කිරීමද කල හැක.

අර්ධ භූගත ටැංකිය

බැරල් ටැංකිය

පොළව මතුපිට ගලා යන වැසි ජලය රැස් කිරීම

ගෙවතු වගාවේ ප්‍රයෝජන

- ගෙවත්ත අලංකාරව සහ පිරිසිදුව තබා ගැනිමට හැකිවිම.
- නිවසට අවශ්‍ය එළවළු,පලතුරු,පලාවර්ග,ඖෂධ, දැව ආදිය ගෙවත්තෙන්ම ලබා ගත හැකිවිම.
- ඉහළ පෝෂණයකින් යුත් සමතුලිත ආහාර වේලක් සදහා අවශ්‍ය අලුත් පිරිසිදු රසායනික වස විෂ වලින් තොර එළවළු,පලතුරු හා පලාවර්ග ගෙවත්තෙන්ම ලබා ගත හැකිවීම.
- අතිරික්ත නිෂ්පාදනය අලෙවියෙන් අමතර ආදායමක් .ලබා ගත හැකිවීම
- පරිභෝජනය සදහා අවශ්‍ය එළවළු සහ පලතුරු මිලදී ගැනීමට වැයවන මුදල ඉතිරි කර ගැනීමට හැකිවීම.
- නිවැසියන්ගේ අමතර ශ්‍රමය ප්‍රයෝජනවත් කාර්යයක යොදා ගත හැකිවීම.
- නිතර අවශ්‍ය වන ගොටුකොළ, කහ, කටුවැල්බටු, පොල්පලා, කෝමාරිකා වැනි අත් බෙහෙත් වර්ග ගෙවත්තෙන්ම ලබා ගැනීමට හැකිවීම.
- භූමියෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට හැකිවීම සහ මානසික සතුටක් ලබා ගැනීමට හැකිවීම.

- **ගෙවත්තට අයත් විවිධ අංග**

1.විවිධ බෝග වර්ග

- එළවළු - බටු,තක්කාලි,මිරිස්,මෑ,බෝංචි කරිවිල, පතෝල,දඹල
- පලතුරු - කෙසෙල්,පැපොල්,අඹ,දෙහි,දොඩම්
- පලා - නිවිති,කතුරුමුරුංගා,ගොටුකොළ, මුකුණුවැන්න,කංකුං
- අලබෝග - බතල,මඤ්ඤොක්කා, කිරිඅල,වැල්අල
- ස්ථිර බෝග - පොල්
- ඖෂධ - ඉඟුරු,කහ,පොල්පලා, කෝමාරිකා
- විසිතුරු පැළ හා මල් වර්ග
- දැව - තේක්ක,මැහෝගනී (විශාල ගෙවතු සදහා)

2.සත්ව පාලන ඒකකයන් - කිරි ගවයින්, මී ගවයින්, එළුවන්, මීමැසි පාලනය

3.ජීව වායු ඒකකය

4.කොම්පෝස්ට් පොහොර වලක්

5.පොකුණක්,මිරිදිය මසුන්,තාරාවන් වැනි සතුන්

6.තණබිම් - විශාල ගෙවතු සදහා

ගෙවතු වගාවේදී වැදගත් වන කරුණු

01 බිම් සැකසීම

අඟල් 6 ක් පමණ ගැඹුරට පස පෙරලා හොදින් කැට පොඩි කර ගන්න.හැකිනම් ගොම පොහොර හෝ අනෙකුත් කාබනික ද්‍රව්‍ය පස සමඟ මිශ්‍ර කිරීම වඩා සුදුසුය. පැල සිටුවීම සදහා අඩි 3 ක් පමණ පළල උස්වූ පාත්ති පිළියෙළ කර ගන්න. තවාන් දමන භෝග වර්ග සඳහා තවාන් සකසා ගැනීම ද කල යුතුය.

02.පැල සිටුවීම

නියමිත ප්‍රමාණයට සකස් කල වලකට කාබනික පොහොර දමා නියමිත පරතරයෙන් පැළ සිටවිය යුතුය.වල් මර්ධනය , පොහොර යෙදීම මෙන්ම පැළයේ නිසි වර්ධනය සඳහා ද වැදගත් වේ.

උදා:- පැල අතර පරතර

මිරිස් - අඩි 1 1/2× 2 , බටු - අඩි 2× 2

පොල් - අඩි 25×25

03. ජලය යෙදීම

ප්‍රමාණවත් පරිදි නියමිත කාල පරාසයකින් ජලය යෙදිය යුතුය. මේ සඳහා මුලුතැන්ගෙයි ඉවත ලන ජලය ද භාවිතා කල හැක.ගෙවතු වගාව සඳහා වැසි ජලය යොදා ගත හැකි අතර ජලය රැස් කිරීමට ගෙවත්තේ පහත් බිම් කඩක් යොදා ගතහැක. ග්ලිරිසීඩියා,පිදුරු,කොහුබත් වැනි දෑ වසුනක් ලෙස යෙදීමෙන් ද පසෙහි තෙතමනය ආරක්‍ෂා කර ගත හැක. අවශ්‍ය ප්‍රමාණයට වඩා ජලය වැඩි වූ විට විවිධ දිලිර සහ බැක්ටීරියා රෝග නිසා පැල කුණු විය හැකිය.

04.වල් පැළෑටි මර්ධනය

පැල අසල වැඩෙන වල් පැලෑටි මුල් අවස්ථාවේදීම අතින් ගලවා දැමීම වඩා සුදුසුය. එම වල් පැලෑටි පස් යට කිරීමෙන් දිරාපත් වන පසට අමතර කාබනික ද්‍රව්‍ය ලැබීමෙන් පසෙහි සරුබව වැඩි කරගත හැක.

05.ආධාරක සිටුවීම

දඹල, මෑ, කරිවිල, පතෝල, වැටකොළු,වැල් බෝංචි,වැල් දොඩම් ආදිය සඳහා ආධාරක සිටුවීම අවශ්‍ය වේ. නැතහොත් ගෙවත්ත වටා ඇති වැටෙහි වුවද මෙම බෝග වල වැල් යැවීම කළ හැක.

06.පොහොර යෙදීම

බෝග වල අස්වැන්න ලබා ගැනීම නිසා පසෙන් ඉවත් වන පෝෂ්‍ය ද්‍රව්‍ය නැවතත් පසට සැපයීම සඳහා කාබනික හෝ රසායනික පොහොර යෙදීම අවශ්‍ය වේ. පසෙහි සරු බව දිගු කාලයක් පවත්වා ගැනීම සඳහාත්, තෙතමනය රඳවා ගැනීම සඳහාත් හැකි පමණ කාබනික පොහොර ලෙස දිරාගිය ශාක හා සත්ව කොටස් යෙදීම වඩා සුදුසුය.

07.පළිබෝධ මර්ධනය

රෝග සහ පළිබෝධකයින් නිසා බොහෝ අවස්ථාවලදී ඵලදාව අඩුවන බැවින් දිනපතා වගාව සුපරීක්ෂාකාරීව බැලීමෙන් රෝග සහ පළිබෝකයින් හඳුනා ගැනීමත් පහසුවෙන් මර්ධනය කිරීමත් කළ හැක. කොළ කන දළඹුවන් සහ අනෙකුත් කෘමීන් පැලෑටි වලින් ඉවත් කර විනාශ කර දැමීම පලිබෝධ හානිය අඩුකර ගැනීමේ පහසුම ක්‍රමය වේ.

ගෙවතු වගාවේ දී පලිබෝධකයින් මර්ධනය සඳහා විකල්ප පලිබෝධ මර්ධන ක්‍රම

(i) කොහොඹ ඇට මිශ්‍රණය

(ii) දුම්කොළ නැටි මිශ්‍රණය

(iii) දැව අළු

(iv) සබන් භූමිතෙල් මිශ්‍රණය

(v)ගෙන්දගම් දුම් ඇල්ලීම

(vi) ඵල ආවරණය කිරීම

(vii) දුම් ගැසීම

(viii) ගොළුබෙල්ලන් මර්ධනය කිරීම

(ix) ගෙවත්ත පිරිසිදුව තබා ගැනීම

08.අස්වනු නෙලීම

ඵල නියමිත ප්‍රමාණයට මේරීමෙන් පසු අස්වනු නෙලීම වැදගත් වේ. අස්වනු නෙලීමේදී වර්ෂාධික දින හෝ අධික වියළි දින මඟ හරින්න. ශාකයේ අනෙකුත් කොටස් වල ට හානි නොකිරීමට ද වගබලා ගත යුතුය.

මෙසේ ගෙවතු වගාවන් ක්‍රියාත්මක කිරීම නිවැසියන්ගේ යහ පැවැත්මට ද තිරසාර හෙට දිනක් සඳහාද රුකුලක් වේ. ජල කළමණාකරනය ද මේ සමඟම බැඳි පවතී. පවතින කුමන ජල ප්‍රභවයකින් හෝ ලැබෙන ජලය නිසි කළමණාකරනයකින් යුතුව භාවිතා කිරීමෙන් ද නිවසේ ඉවත ලන ජලය ගෙවතු වගාවට යෙදීමෙන් ද ජල ගැටළුව සඳහා ප්‍රායෝගික විසඳුම් ලබාගත හැක

වැසි ජලය මූලික ජල ප්‍රභවය වන නිවැසියන් ද ඉතා සාර්ථකව ගෙවතු වගාව කර ගෙන යන බව කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය සමඟ ලංකා වැසි ජලය රැස් කරන්නන්ගේ සංසදය මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිය මගින් තහවුරු කර ඇත.

සාර්ථක ගෙවතු වගාවක් තුලින් තිරසාර හෙට දිනයක් ලඟා කර ගැනීමටත්,වැසි ජල තාක්ෂණය තුලින් මනා ජල කළමණාකරනයටත් වැඩි විස්තර ලබාගැනීමට අප අමතන්න

ලංකා වැසි ජලය රැස්කරන්නන්ගේ සංසදය
28/3A, සුභද්‍රාරාම මාවත
නුගේගොඩ
දු.ක:011-5524612
ෆැක්ස්:011-2768520
ඊමේල්: lrwhf@sltnet.lk , tanuja@sltnet.lk
වෙබ් අඩවිය:www.lankarainwater.org

වැසි ජලය රැස් කිරීම සහ ගෙවතු වගාව තුලින් ගෙවත්තෙන් නිසි ඵල ලබමු

ලංකා වැසි ජලය රැස්කරන්නන්ගේ සංසදය

කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනය (CIDA) වැඩසටහන් ආධාර ඒකකය